# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,800 — 1961 දෙසැම්බර් 9 වැනි සෙනසුරාදා — 9.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඩබ්ලිව්. 64/61 (9).

### මහාජන ආරක්ෂක ආඥපනත

අගමැතිගේ නිර්දේශය අනුව 40 වෙනි අධිකාරය වන මහාජන ආරක්ෂක ආඥපනතෙහි 5 වෙනි වගන්තිය යටතෙහි අග්‍රාණ්ඩුකාරවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

ඕ. ඊ. ගුණතිලක,
අග්‍රාණ්ඩුකාරවරයා.

1961 දෙසැම්බර් 9,
කොළඹ,
අග්‍රාණ්ඩුකාරවරයාගේ කාර්යාලය.

### නියෝගය

යම් හදිසි නියෝගයක් යටතේ පනවනු ලැබූ යම් හදිසි (අඳුරු නීතිය) ආඥවක් උල්ලංඝනය කිරීමේ වරද සම්බන්ධයෙන් සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ තැනැත්තකු, මේ නියෝගය ක්‍රියාත්මක වීමට පෙර හෝ පසුව එසේ උල්ලංඝනය කරනු ලැබුවේ හෝ නො කරනු ලැබුවේ නමුදු, තුන් මසකට අධික නොවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්සියයකට නො වැඩි දඩයකට හෝ එබඳු බන්ධනාගාරගත කිරීම හා එබඳු දඩය යන දෙකට ම යටත් විය යුතු ය.

වෙනයම් හදිසි නියෝගයක මෙයට විරුද්ධ ව කුමක් සඳහන් වුව ද මේ නියෝගයෙහි පෙරාතුව විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මේ නියෝගයෙහි " හදිසි නියෝගය " යන්නෙන් මහාජන ආරක්ෂක ආඥපනත යටතෙහි 1961 අප්‍රියෙල් 17 වෙනි දින හෝ ඉන් පසුව පනවනු ලැබූ යම් නියෝගයක් අදහස් වේ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2259—ජේ. ඇන්. ආර් 248—7,020 (61/12)